# නිර්මාණ Nirmana

## අනියත නියතය

ගහ කොළ පරිසරය සත්වග වැඩෙන නියා
සෝබාවිකත්වයෙ අනියත දහම සොයා
අත්හැර රජ සැපත් ජර දුක් නසමි කියා
සිදුහත් කුමරු මාලිගයෙන් පිටව ගියා

අදිටන නොබිඳ නැණ බල සති පිටව නොයා
කුමරෙක් නැණැති සැබිදම් මහ මගෙහි ගියා
මෙත් කරුණාව සතවෙත ලොව වැඩුව දයා
පසක් කළා දම නොමැරෙන සමිඳු පියා

බණ භාවනා බුදු දහමෙහි අනගි මුතු
උගත මනා සදහම් ගුණ වැඩිය යුතු
උපත දිනා මිනිසත් බව පැතිය යුතු
අකුසල් උනා සසරෙහි බැමි සිඳිය යුතු

මිනිසුන් මිනිස් වග නිවහල් කරත යුත
ඉගෙනුම දහම බුදු වදහළ දහමෙ ඇත
අත්වෙයි නිවන අද කරනා කරුණු මත
නොතබනු හෙටට හෙට ඒවිද නැත නියත

නුවණක් ලද නොලද කිසිවෙකු කිසි දාක
එළියක් බෙදුව දැකුමට විස්වයෙ නේක
හැමදුක් නැසුව දැල්වෙන ගින්නෙහි සෝක
තිලොවක් දිනුව හිමි අද බුදු වූ සේක

♦ **කරුණා බස්නායක**
**Hampstead UK**

## සාදු සාදු බුදුහිමියන් වඳින්නෙමි

බුදු ගුණ සුළඟ සේ ලොව තුළ පැති රේවා
සිල් මල් සුවඳ දසඅතටම විසි රේවා
සැනසුම සතුට නිරතුරුවම ඇති වේවා
නිවන් දකින තැන බුදුහිමි හමු වේවා

හදවත් හැමගෙ මෙත් සිසිලෙන් යුතු වේවා
හැම සත්වග ලොවේ නිදුකින් වැජ ඹේවා
සාමය සමගි දම ලොව තුළ රජ වේවා
බුදුහිමි දෙසූ දහමෙන් ලොව සැන සේවා

මල් පැන් දෙහොත් මුදුනේහී රැගෙන එමී
පිහිටක් ඔබෙන් හැර වෙන කාගෙන්ද හිමී
සසරේ මේ දුක දවසක වෙන්න නිමී
ලොවේ උතුම් බුදුහිමියන් වඳින් නෙමී

ඇසළ මහේ අබිනික්මන් කෙරුව දිනේ
සියළු සතුන් වෙත පා කරුණාව සෙනේ
බුදුබව ලබා වෙසගේ පුන් පෝය දිනේ
ලොවටම බෙදා දුන්නා බුද්ධියේ ධනේ

සාගර සමව කෙළවර නැති සංසාරේ
යළි යළි උපත වේ දුක් ගිනි මැද නිතරේ
එනමුදු වඳිමි බුදුහිමි දවසක් නැරේ
කෙළවර වෙන්න මඩ වගුරෙන් මේ කතරේ

♦ **අංජලී දිල්රුක්ෂි රත්නායක**
Montreal **France**

## අක්කා මියගියා

පරපුර දෙකක දරු කැළ වෙත සිප් මීර
පොවමින් විවර කළ යායුතු නිසි පාර
අවසන් ගමන් යන මැණිට සුර වීර
මේ කවිකුසුම් දම් වේවා උප හාර

සෝමානන්දයට ඉටුකළ වෙහෙස ඔබේ
පවසති දනෝ තුඩ තුඩ අවමඟුල් සබේ
ගුණකඳ සිහිව නැගුණා නෙතත කඳුළු ඉබේ
ඔබෙ රුව සදා දිදුලයි හද ගගන ගැබේ

නන්දා පියසීලි සෝමානන්දෙ සිටී
කීවා මෙවැනි දුක් කවිවැල් කඳුළු වැටී
මගෙ අක්කගේ ගුණවරුණා කියපු හැටී
අහගෙන ඉන්න ලැබුණා එය අපට වටී

මගෙ මව මියගියා ඒ තැන අර ගන්න
අක්කා අපව ආදරයෙන් රැක උන්න
ලෝ දම අනුව සිදුවිය අප හැර යන්න
එහෙයින් සැවොම විය කඳුලැලි වගුරන්න

පෙන්වා නියම සොහොයුරු පෙම හැමදාම
දුක සැප අසයි තලබණුවෙන් හැමදාම
අපි සිව් දෙනා එකවාගෙයි හැමදාම
සිටියා එකමුතුව මව්පිය කී සේම

ලෝ දම අනුව අක්කා මිය ගිහින් ඇත
දහමට පිනට යෙදවුවා ඇගේ සිත
නිවනට යන්න අක්කට පින් පිරී ඇත
සනසා ගනිමි මම එහෙයින් මගේ හිත

♦ **ප්‍රේමා සුරවීර රූපසිංහ**
නුගේගොඩ **Sri Lanka**



## වෙසගේ බුදුගුණ සිතමින්

අජරාමර බවට පත් බිඳ සසර බැමී
සිහිකොට බැති බරව තිලොවට තිලක හිමී
මුණි සිරිපා කමල වෙත මොහොතකට නැමී
වෙසගේ පොහෝ දින යළි බුදු සරණ යමී

යාමට එතෙර වී බව දුක් සයුර දිග
දියනද ලොවට පෙන්වා දුනි නියම මග
තරණය කළ දිනක සදහම් පහුර නැග
හැකිවේ පුහුදුනට දැකුමට සසර අග

මනුලොව ජනිත සත බලයෙන් පෙර පිනක
හරි මග යැවීමට දහමක් දුන් කනක
අසරණ සරණ හිමි අද වැනි පොහො දිනක
සිහිකළ සැනින් මතුවෙයි සුව හිත කොණක

රජ මැදුරටත් පැල්පතටත් එක ලෙසට
වඩිමින් බණ දෙසූ යාමට සුගතියට
ආදර මවක් මෙන් පොඩි කිරි දරුවෙකුට
හිමි සඳ පිහිට විය එකසේ මුළු ලොවට

ලංකර දෙනු පිණිස නිවනට මෙලොව සත
විඳි දුක් අපමණය සම්බුදු තිලොව නෙත
පිහිටෙන් හිමි සඳුගෙ ගුණ කඳ අපරිමිත
දුක් ගිනි මැළ නිවේවා! මිහිතලය මත

සම්බුදු ගුණ සුවඳ විහිදෙන විට දෙරණින්
පැහැපත් වී දිලෙන වෙසගේ සඳ කිරණින්
සාමය සතුට ලැබ තෙරුවන් රැක වරණින්
මුළු ලොව දිනේවා! සරුවට බුදු සරණින්

♦ *අභාවප්‍රාප්ත*
**සිරිසෝම හරිශ්චන්ද්‍ර කිව්දු**

## දහම්දීපය සහ අද

අස්තිර ලොවක ඉස්තිර නැති දිවිය පුරා
විස්තර කියන්නෙමි බුදු ගුණ සිතේ දරා
ඉදිකටු සිදුරකින් මෙන් ගුණ මතක් කරා
බුදුහිමි දෙපා නමදිමි අත්මුදුන් කරා

කරුණා දයා ගුණ බණපොත්වල ඇත්තේ
ඉසිකෝ මාන අප හද ඇතුළේ ඇත්තේ
බොදු හැදියාව අද වල්මත් වී ඇත්තේ
දම්දීපයක හැටි මෙහෙමද දත යුත්තේ

ගිය කල මළ ගෙදරකට බෝ දුක් වන්නේ
ආ විට ගෙදර ඒ හැම අමතක වන්නේ
වස්තුව දනය ගැනමයි නිති පොර කන්නේ
පන්සිල් ගන්නවා මිස නැහැ රැක ගන්නේ

දෙහි ගෙඩියකට ලුණු ඇයට ශතය කට
දිය බිඳුවකට ඉදිකටුවට දබර කොට
දහ පහළොස් දෙනෙක් කැතිගා මරණ රට
එක දිනකට හැකිද බුදුහිමි රවටන් ට?

♦ **එස් කන්කානම්ගේ**
**London SE5**

## යළි වඩිනු මැනවි !


හිත්පිත් නැති හිස්
මිනිසුන්ගේ
නැණ නුවන පහදන්න
දූෂණයෙන් වංචාවෙන්
බියෙන් තැතිගත්
අද මිනිසුන්ගේ සිත්
සනහාලන්න
හැකිනම් වඩින්න
බුදුහිමියනි
මේ වෙසක් මහේ !
තව එක වතාවක්
මගේ දේශයට
දුර්භික්ෂ විසාලා
මහ නුවරට
දෙවෙනි නැහැ
අද මගේ බුද්ධ දේශය

♦ **ලුම්බිණී විතාන**
**Langley UK**

## බුදුන් වහන්සේ

සසර නිසරුබව සත වෙත
නුවණින් පහදා
නිවනට මහ සෙවූ සේක
බුදුන් වහන්සේ
හද තුළ ගිනි පුපුරු නහයි
ඉසිකෝ මානයෙන් බැඳී
සිතිවිලි නෙක ගොදුරුසොයයි
කෙළෙස් විමානයට වැදී
මෙත් මුදිතා කරුණා ගුණ
නුවණින් පහදා
ඒ සීමා නැසූ සේක
බුදුන් වහන්සේ......!
වස්තුව සරිකරයි සදා
තණ්හා රැහැණින් පැටලී
පස්කම් සැප විඳී බදා
ආශා රැහැණින් වැටලී
සමාධි පඤ්ඤා ශීලය
නුවණින් සාදා
ඒ සීමා නැසූ සේක
බුදුන්වහන්සේ ......!

♦ **මාලපල්ලේ**
**කුමුදු රොහාන් අමරසිංහ**
Edmonton **London UK**



## පැතුම !

සඳරැස් විහිදී අඳුර නැසේවා
මඳ නළ හමනා සුවය ගෙනේවා
හදවත බුදු බැතියෙන් ඉතිරේවා
හිමි තෙමඟුල ඉහළින් සැමරේවා

සිත කය වචනය සංවර වේවා
නිතරම බුදු බණපද මිමිණේවා
ගත සිත බුදු සිසිලෙන් පිබිදේවා
සතවෙත මෙත් කරුණා අත්වේවා

**තිස්ස කුමාර කෝරාළගේ**
**Sri Lanka**

## දිනුමක පරාජය

යුද ගිනි ඇත නිවී
මුළු රටම පහන්වී
මහද ගිනි ගෙන දැවී
සිටිමි මම ගෙයි තනිවී

දිනුම අත ළඟ තියා
රණබිමේ දුර නොයා
සටන නිම දුටු දිනේ
පුතු මගේ මියගියා

යුද්ධයෙන් ලද දිනුම
තුටු කෙරෙති හැම දෙනම
පුතු නැතිව තැවෙමි මම
පැරදුමකි මට උරුම

**සුනිල් පෙරේරා**
Skegness **Lincs UK**

## චිරං ජයතු ලංකා විත්ති !

දිනු මවුබිමෙන් බැහැරව ගතවන දවසේ
තනිකම නිමක් නැත සිරවී ඇත මනසේ
නුබ ගැබ සිසාරා දිදුලන හිරු විලසේ
පැයූ තරුව නුඹ විය ලන්ඩන් අහසේ

තරණය කරනු වස් නවනළු මහ සයුරු
රස ලෝලයින් එකමුතුකර බැඳි පහුරු
ගිලිහී ගියද එක දෙක මිණිකැට ඇතිරු
මතුවෙයි තව තවත් අගනා කවි අහුරු

පිටුපා නොගිය රට ජාතිය ආගමට
කිසි දින කිසි තැනකදී නොමවිය නිවට
සැනසුම ගෙනා සිඳ ජීවන දුක් ගැහැට
ආනන්දයකි ලංකාවිත්තිය මෙමට

දුක්බර සිතට සිත නිවනා පවනක් වී
අක්මය දනට පිට තලනා මුගුරක් වී
පසළොස් වසක් නොනැවත සපැමිණි පේවී
බක්මහ අසිරියට තව සැණකෙළියක් වී

සාහිත ලොවේ හෙළ බස් මල් පුබු දාන
නැණ බල ගුණ සපිරි රස තොරතුරු ගේන
සකිසඳ නිබඳ දුර සිට හසරැළි පාන
අද මෙන් මතුද ඔබ පැමිණෙන්නට ඕන

♦ ***Dr* ශ්‍රියා කුමාරසිංහ**
**Dunedin - New Zealand**

## ලංකාවිත්ති යුවතිය !

අනූ හතේ බක්මාසේ ඒ කාලේ
විළිබර බවක් දැනුණේ අප සිත් පතුළේ
වාසනාව කැටිකර ගෙන මුව කමලේ
සුරතල් බිළිදියක බිහිවුණි අප පවුලේ

ආගම දහම දැ අබිමන වටින ඉතා
ලොව දස දිගට විහිදුණු රස පිරුණු කතා
කවි සිතුවිලි සමග කැටිකොට එකට ගොතා
නවතනු බැරි සිනා ඇහුවම විහිළු කතා

දින සති මාස ගතවී කල් ගෙවන විට
නැණ ගුණ රුවය මතුකරගෙන යස හැඩට
ඇසුරුකරන අය වෙත දුන් සිත සතුට
උපමා සොයමි ඔබ ගැන ගුණ ගයන් නට

සුකොමළ බවට සමවේ රතු නා දල්ල
එඩිතර බවට සම අසිපත හා හෙල්ල
මල්වර වියට එළඹුණි දි සැන සිල්ල
ලංකාවිත්ති යයි ඒ ලස්සන කෙල්ල!

♦ **කුමාරි විජේරත්න**
Hounslow Middx **UK**

## දියණියට !

හැකි හැම විටම දැනුමක් රැස් කර ගන්න
හොඳ සිතුවිලි වලින් ලෝකය සර සන්න
මනස මෙහෙයවා දැතින් වැඩ ගන්න
පිරුණු බඳුනෙ දිය නොසැලෙයි දැන ගන්න

අද කටයුතු හෙටට තව කල් නොදමන් න
කිසිවිට අනුන් උපකාරය නොපතන් න
තම දුක හෝ සැපය අනුනට නොකියන් න
ගහ යට වැහි දෙකක් වෙයි සිහියට ගන් න

නිතරම අවට ගැන සිහියෙන් පසු වන්න
දුක් කරදර එන්ට පෙර ඒ වළ කන්න
සෝබා දහම ගැන විමසිල්ලෙන් ඉන්න
නිසංසල තැනෙහි ජල ගැඹුරයි ඔන්න

තම ජීවිතය ආදරයෙන් සුර කින්න
රට දැය ආගමට ගෞරවයෙන් ඉන්න
ඔබෙ චරිතය පණට වැඩියෙන් රැක ගන්න
ගොම බිංදුවක් කිරි කළයට නොදමන්න!

♦ **ප්‍රදීපා වික්‍රමසිංහ London SW19**

## Love hurts

In most religions love is regarded as the highest good. The love show to others is a pale reflection of the love that God gives to us. Buddhism is different. Love is a form of attachment. Much of what we call love is actually selfish, greedy and dependent. We hang on to other people desperately because we are afraid of being alone. This does not mean that Buddhists are condemned to a solitary, loveless existence. It means that, like all attachments, it must be recognised for what it is. We can grow into a state where we care for others in a way that is not self-seeking, but it takes thought and a lot of work.

♦ **Robert Allen**